# ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය
## (කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය)

**ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් ස්ථිර තනතුරු සඳහා මූලික සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**01. <u>නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මූල්‍ය) තනතුරු - 01</u>**

**A. බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් -: (පහත සුදුසුකම් I හෝ II)**

I. ගිණුම්කරණය, කළමනාකරණය, වාණිජ්‍ය යන විෂයය ක්ෂේත්‍රයකින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

සමඟ

එකී විෂය ක්ෂේත්‍රයකින් ලබාගත් පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම / ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ (ICASL) / එක්සත් රාජධානියේ වරලත් කළමනාකාරීත්ව ගණකාධිකරණ ආයතනයේ (CIMA) / එක්සත් රාජධානියේ සහතිකලත් ගණකාධිකාරීන්ගේ වරලත් සංගමයේ (ACCA) ආශ්‍රිත සාමාජිකයෙකු වීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ" මට්ටමේ තනතුරක අවම වශයෙන් ගිණුම්කරණ හෝ විගණන විෂය ක්ෂේත්‍රයේ වසර 12 පළපුරුද්දක් ලබා තිබීම.

II. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ (ICASL) / එක්සත් රාජධානියේ වරලත් කළමනාකාරීත්ව ගණකාධිකරණ ආයතනයේ (CIMA) / එක්සත් රාජධානියේ සහතිකලත් ගණකාධිකාරීන්ගේ වරලත් සංගමයේ (ACCA) පූර්ණ (Fellow) සාමාජිකත්වය ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනය "කළමනාකරණ" මට්ටමේ තනතුරක අවම වශයෙන් ගිණුම්කරණ හෝ විගණන විෂය ක්ෂේත්‍රයේ වසර 12 ක පළපුරුද්දක් ලබා තිබීම.

**B. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් -: (පහත සුදුසුකම් I හෝ II)**

I. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

II. මණ්ඩලයේ කළමනාකරණ සේවා ගණයේ (MM) පළමුවන ශ්‍රේණියේ මූල්‍ය හෝ විගණන විෂයට අදාළ තනතුරක වසර 05 සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස් සීමාව - :** අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් ක්‍රමය -:** 2016.04.25 දිනැති 02/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව තනතුරට හිමි වැටුප් ප්‍රමාණය HM 1-1 2016 - රු. 81,670.00 – 15x2270 – 115,720.00 ක් වේ.

**බඳවා ගැනීමේ දී වැටුප් තලය -:** රු. 81,670.00 වේ.

**වෙනත් දීමනා -:** රජය මඟින් අනුමත දීමනා හා පහසුකම් හිමි වේ.

- ජීවන වියදම් දීමනාව
- විශේෂ දීමනාව
- වෘත්තීය දීමනාව
- රාජ්‍ය පරිපාලන 01/2015 අනුව වෙන් කළ වාහනයක් හෝ වාහන දීමනාව සහ අනුමත ඉන්ධන දීමනාව
- දුරකථන දීමනාව
- අනෙකුත් අනුමත දීමනා

**02. <u>සහකාර සාමාන්‍යාධිකාරි (පාලන) තනතුරු – 01</u>**

**A. බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් -: (පහත සුදුසුකම් I හෝ II)**

**I. මානව සම්පත් කළමනාකරණය / ව්‍යාපාර කළමනාකරණය/ රාජ්‍ය පරිපාලනය/ වාණිජ්‍යවේදී යන විෂය ක්ෂේත්‍රයකින් ලබාගත් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක්**

සහ

උපාධිය ලබාගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

II. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නාවූ , පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරික්ෂණය සමත් වීම සහ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

**B. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් -: (පහත සුදුසුකම් I හෝ II)**

I. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

II. **"කණිෂ්ඨ කළමනාකරණ"** (JM) සේවා ගණයේ අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස් සීමාව - :** අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් ක්‍රමය -:** 2016.04.25 දිනැති 02/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව තනතුරට හිමි වැටුප් ප්‍රමාණය HM 1-1 2016 - රු. 53,175.00 – 10x1,375 – 15x1,910 - 95,575.00 ක් වේ.

**බඳවා ගැනීමේ දී වැටුප් තලය -:** රු. 53,175.00 වේ.

**වෙනත් දීමනා -:** රජය මඟින් අනුමත දීමනා හා පහසුකම් හිමි වේ.

**03. <u>ගිණුම් නිලධාරී (රුස්කිරීම්) තනතුරු - 01</u>**

**A. බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් -: (පහත සුදුසුකම් I හෝ II)**

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ගිණුම්කරණය, වාණිජවේදී උපාධියක් හෝ කළමනාකරණ උපාධියක්

II. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නාවූ, පිළිගත් වරලත් වෘත්තිය ආයතනය අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත් වීම.

**B. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් -: (පහත සුදුසුකම් I හෝ II)**

I. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

II. කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (MA 1-1) සේවා ගණයේ II (I) ශ්‍රේණියේ ගිණුම් හෝ විගණන කටයුතු පිළිබඳ තනතුරක වසර 05 ක සතුටුදායක සේවා කාලයක් තිබීම.

**වයස් සීමාව** - : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් ක්‍රමය -:** 2016.04.25 දිනැති 02/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව තනතුරට හිමි වැටුප් ප්‍රමාණය JM 1-1 2016 - රු. 42,600.00 – 10x755 – 18x1,135 - 70,580.00 ක් වේ.

**බඳවා ගැනීමේ දී වැටුප් තලය -:** රු. 42,600.00 වේ.

**වෙනත් දීමනා -:** රජය මඟින් අනුමත දීමනා හා පහසුකම් හිමි වේ.

**04. <u>දත්ත පරිපාලක තනතුරු - 01</u>**

**A. බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් -:**

I. තොරතුරු තාක්ෂණය විෂය ක්ෂේත්‍රයෙන් ලබාගත් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධිය

**B. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් -:**

I. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් අදාළ වේ.

**වයස් සීමාව** - : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් ක්‍රමය -:** 2016.04.25 දිනැති 02/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව තනතුරට හිමි වැටුප් ප්‍රමාණය MA - 3 2016 - රු. 32,200.00 – 10x445 – 11x660 - 10x730 - 5x750 – 54,960.00 ක් වේ.

**බඳවා ගැනීමේ දී වැටුප් තලය -:** රු. 32,200.00 වේ.

**වෙනත් දීමනා -:** රජය මඟින් අනුමත දීමනා හා පහසුකම් හිමි වේ.

**05. <u>පරිගණක ජාල සහකාර තනතුරු - 01</u>**

**A. බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් -:**

I. පරිගණක වැඩසටහන් සකස් කිරීම සම්බන්ධව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (V) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**B. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් -:**

I. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් අදාළ වේ.

**වයස් සීමාව** - : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් ක්‍රමය -:** 2016.04.25 දිනැති 02/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව තනතුරට හිමි වැටුප් ප්‍රමාණය MA 2-1 2016 - රු. 30,310.00 – 10x300 – 7x350 - 4x495 - 20x660 – 50,940.00 ක් වේ.

**බඳවා ගැනීමේ දී වැටුප් තලය -:** රු. 30,310.00 වේ.

**වෙනත් දීමනා -:** රජය මඟින් අනුමත දීමනා හා පහසුකම් හිමි වේ.

මෙම තනතුරු ස්ථිර ය. සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට දායකත්වය හිමි වේ. වසර තුනක පරිවාස කාලයකින් පසු ස්ථිර කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල මත තනතුර සඳහා බඳවාගනු ලැබේ.

ඔබගේ අයදුම්පත්‍රය **"සභාපති, ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය, අංක 18, රාජගිරිය පාර, රාජගිරිය"**යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ප්‍රධාන කාර්යාලයේ පාලන අංශය වෙත 2023.12.13 දිනට පෙර ගෙනවිත් බාරදීම කළ යුතුය. දැනටමත් රාජ්‍ය අංශයේ හෝ ව්‍යවස්ථාපිත ආයතනවල සේවය කරන අයදුම්කරුවන් ආයතන ප්‍රධානියා මඟින් අයදුම් කළ යුතුයි. අයදුම්පත එවන ලිපි කවරයේ වම් ඉහළ කෙළවරෙහි අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුයි. වැඩිදුර තොරතුරු www.ssb.gov.lk වෙබ් අඩවිය තුළින් ලබාගත හැක.

**සභාපති,**
**ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය,**
**"සමාජ ආරක්ෂණ පියස",**
**අංක 18, රාජගිරිය පාර,**
**රාජගිරිය.**
**2023.11.29**